# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන)

**1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින්
2018 අප්‍රේල් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 මාර්තු මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[240 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ මණ්ඩලයේ සාමාජිකයින් වෙනස් කිරීම ය.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 3 වන වගන්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ''ජාතික ආරක්ෂාව'' යන වචන ආදේශ කිරීම ය.

## ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන)

එල්. ඩී.—ඕ. 34/2017

**1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක   දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1985 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

''(අ) පහත දක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්:—

(i) ජනරජයේ ජනාධිපති ලේකම්වරයා;

(ii) ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; සහ'';

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය නැවත (ආ) ඡේදය වශයෙන් අංකනය කිරීමෙන්; සහ

(3) (3) වන සහ (4) වන උපවගන්තිවල ''(2) වන උපවගන්තියේ (ඇ) ඡේදය'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''(2) වන උපවගන්තියේ (ආ) ඡේදය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙහි ''ජනාධිපතිවරයා'' යන වචනය වෙනුවට ''ජනරජයේ ජනාධිපති ලේකම්වරයා'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියෙහි ''මුදල්,'' යන වචනය වෙනුවට ''ජාතික ආරක්ෂාව'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.